**ඒඩ්ස් ක්ෂය රෝගය සහ මැලේරියාව මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතිය (GFATM ව්‍යාපෘතිය) - 2018**

---

ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල අතර 2016 පෙබරවාරි 29 දින එළඹි අංක 857 - එල්කේඡ්/ටී/එම්ඕඑච් දරන ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘතියේ කාලය

---

ප්‍රදාන ගිවිසුම ප්‍රකාරව, සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සහ මෙහෙයවීමේ නියෝජිත ආයතනය වේ. ශ්‍රී ලංකාව තුළ ක්ෂය රෝග මර්ධනය කිරීමේ වැඩ සටහන ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ කටයුතු ක්ෂය රෝග නව මූල්‍යනය ආකෘතිය නමින් ක්ෂය රෝග සංරචකය යටතේ ක්‍රියාත්මක වේ. ප්‍රදාන ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මිලියන 1,033.99 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 7.91 ක් වන අතර එය ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව පිළිබඳ ගෝලීය අරමුදල විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට යෝජිතව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2021 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

---

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම, උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්‍ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද ,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීම්දී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාව අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------------

## 2.1. නීති,රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------------

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(5) සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | (අ) | සලසා ඇති ප්‍රතිපාදනවලට පටහැනිව, උපරිම අනුමත සීමාව වූ රු.100,000 ඉක්මවා අවස්ථා 17 කදී එකතුව රු.මිලියන 242.86 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | අදාළ රෙගුලාසි සහ අභ්‍යන්තර පාලන පද්ධතීන්ට අනුකූල නොවීම. | අදහස් දක්වා නැත. | අනුමත උපරිම සීමාව ඉක්මවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ආ) | අදාළ කාර්ය සඳහා අවශ්‍ය ආසන්නතම දිනයේදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 78 කදී එකතුව රු.මිලියන.1.96 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම නියමිත දිනට මාස 02 සිට මාස 09 දක්වා කාලයකට පෙර නිකුත් කර තිබුණි. තවද, අවස්ථා 61 කදී නිකුත් කර තිබුණු රු.මිලියන 1.75 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ අවශ්‍යතාවය ඉටු කරගැනීම සඳහා යෙදවීමකින් තොරව මාස 01 සිට මාස 10 දක්වා ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණු බව නිරීක්ෂණය විය. | අදාළ රෙගුලාසි සහ අභ්‍යන්තර පාලන පද්ධතීන්ට අනුකූල නොවීම. | අදහස් දක්වා නැත. | අදාළ කාර්ය සඳහා ආසන්නම දිනයේදී අත්තිකාරම් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර ප්‍රමාදයකින් තොරව නිරවුල් කිරීමටද කටයුතු කළ යුතුය. |

**3.** **භෞතික කාර්යසාධනය**

**3.1** **ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ක්ෂය රෝග මර්ධන නව මූල්‍යයන ආකෘතිය යටතේ වියපැහැදම් ඉල්ලීම්වලට අනුව, ව්‍යාපෘති කාලය තුළදී අයවැය පිරිවැය කාණ්ඩ 11 ක් යටතේ අයවැය ක්‍රියාකාරකම් 461 ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණි. අයවැය ක්‍රියාකාරකම් 26 ක් යටතේ රු.මිලියන 38.55 කට සමාන එක්සත් ජනපද ඩොලර් 237,192 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 9.67 කට සමාන එක්සත් ජනපද ඩොලර් 59,467 ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද අයවැය පිරිවැය කාණ්ඩ 8 ක් යටතේ වෙන් කරන ලද රු.මිලියන 38.24 කට සමාන එක්සත් ජනපද ඩොලර් 235,267 ක ප්‍රතිපාදනය ඉක්මවා රු.මිලියන 98.94 කට සමාන එක්සත් ජනපද ඩොලර් 608,691 ක් ව්‍යාපෘතිය විසින් වැයකර තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අවදානම සහ ප්‍රතිපාදන නියමිත වේලාවට උපයෝගී කර ගැනීම. | අදහස් දක්වා නැත. | ලැබෙන සියළු අරමුදල් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝගී කර ගැනීමට පියවර ගත යුතුය. |

**3.2** **උපයෝජනය නොකළ සම්පත්**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ව්‍යාපෘති කාලය තුළ උපයෝජනය කිරීමට අපේක්ෂිත රු.මිලියන 1,033.99 කට සමාන එක්සත් | අපේක්ෂිත කාර්යය ඉටු කිරීමේ අවධානම. | අදහස් දක්වා නැත. | ලැබෙන සියලු අරමුදල් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යොදා ගැනීමට |

| | | | |
|---|---|---|---|
| ජනපද ඩොලර් මිලියන 7.91 ක මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 979.10 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 6.26 ක් පමණක් 2018 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර තිබුණි. තවද, රු.මිලියන 34.13 කට සමාන එක්සත් ජනපද ඩොලර් 210,086 ක් සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබුණි. | | | පියවර ගත යුතුය. |

**3.3** **මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2008 වර්ෂයේ සිට ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදී ගෙන තිබුණු පිරිවැය රු.මිලියන 522.84 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 2.88 ක වත්කම් සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. | ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් පාලනය කිරීම දුර්වලවීම. | අදහස් දක්වා නැත. | භෞතික සත්‍යාපනය සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති ගනුදෙනු සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනයක් සිදුකර නොතිබුණි. ඒඩ්ස් ක්ෂය රෝග සහ මැලේරියා මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදලේ ක්ෂය රෝග මර්ධනය කිරීමේ නව මූල්‍යයන සංරචකයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මත වරලත් | අනුගමනය කල යුතු නීති හා රෙගුලාසි අනුගමනය කිරීමට අසමත් වීම | අදහස් දක්වා නැත. | විගණකාධිපතිවරයාගේ අභිමතය ලබා ගැනීමට කටයතු කළ යුතුය. |

ගණකාධිකාරී සමාගමක් විසින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත වෙනම විගණන වාර්තාවක් නිකුත් කර තිබුණු අතර එමගින් තත්වාගණනය නොකළ විගණන මතයක් ප්‍රකාශකර තිබුණි. කෙසේ වෙතත් ඒ සඳහා විගණකාධිපතිගේ අභිමතය විමසා නොතිබුණි.

## 3.4 පද්ධති සහ පාලන

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| රෝගීන් පිළිබඳ තොරතුරු නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් යාන්ත්‍රණයක් රේඛීය අමාත්‍යාංශය සතුව නොතිබීම සහ රෝගීන් තම රෝගයේ ස්වභාවය හෙළිදරව් කිරීමට ඇති අකමැත්ත වැනි හේතු කිහිපයක් නිසා, ක්ෂය රෝගීන් සංඛ්‍යාව සහ එම රෝගයෙන් සිදුවන මරණ සංඛ්‍යාව පිළිබඳ යාවත්කාලීන කරන ලද දත්ත රේඛීය අමාත්‍යාංශය සතුව නොතිබුණු බව විගණනයේදී අනාවරණය විය. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල ඵලදායීතාවය මැනීමට නොහැකි වීම. | අදහස් දක්වා නැත. | ක්ෂය රෝගීන් සහ එම රෝගයෙන් මිය යන්නන්ගේ තොරතුරු නඩත්තු කිරීම සඳහා යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |